# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2061/12 - 2018 මාර්තු මස 06 වැනි අඟහරුවාදා - 2018.03.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 132/29(ii)

**රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥාපනත**

(283 වැනි අධිකාරය වූ) රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගම් ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමය විසින් සාදනු ලැබ මුදල් විෂය භාර අමාත්‍යවරයා අනුමත කරනු ලැබූ රීති.

ලේකම්,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2018 ක් වූ පෙබරවාරි මස 20 දින,
කොළඹ දී ය.

රීති

කලින් කල සංශෝධිත හා 2012 සැප්තැම්බර් මස 28 වන දින අංක 1777/38 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අවසන් වරට සංශෝධිත 1892 ජුනි මස 17 වන දින අංක 5147 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) 1 වන පරිච්ඡේදය - ''පොදු ව්‍යවස්ථා'' යන ශීර්ෂය යටතේ -

(අ) 6 වන රීතියේ -

(1) (අ) උප රීතියේ (1) වන ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''රජයේ විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් අනුව හෝ ඉල්ලා අස්වීම මගින් හෝ 7(අ) වගන්තිය යටතේ ධූරයෙන් නෙරපනු ලැබීමෙන් හෝ 7(අ) (1) යටතේ සාමාජිකයෙකු වීම අවසන් වීමෙන් රාජ්‍ය සේවයෙන්, පළාත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් පාලන සේවයෙන් විශ්‍රාම ගිය යම් තැනැත්තකු විසින් අංක 12 හා අංක 13 යන රීති යටතේ ලබාගත් සෑම ණය මුදලක්ම හෝ අත්තිකාරම් මුදලක්ම හා II වන පරිච්ඡේදය යටතේ ලබාගෙන ඇති දේපළ ණය මුදල් ශේෂය ද ගෙවා බේරුම් කරන ලෙස එම සාමාජිකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය. මෙකී මුදල්, සම්පූර්ණ දායක මුදලින්, පොලියෙන් සහ යම් ඉතිරි මුදලක් ඇත්නම් එකී මුදලින් සමන්විත විය යුතු ය. එම ඉල්ලීම කරනු ලැබූ විට, ණය මුදල පියවීම සඳහා ඉල්ලා ඇති අවසාන දිනය දක්වා ගණන් බලා පොලිය අයකරනු ලැබිය යුතු ය.''.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) (අ) උපරීතියේ (ii) වන ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''12 සහ 13 වන රීති යටතේ සහ ලබාගත් දේපළ ණය සඳහා දායක මුදල් සහ බැර කරන ලද පොලිය ගෙවා බේරුම් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ සහ එකී මුදල 6 (අ) (1) රීතියේ විධිවිධාන සලසා ඇති පරිදි ගෙවා බේරුම් කළ යම් සාමාජිකයකු විසින් ප්‍රදානමික සාමාජික ගාස්තු ගෙවීමට කැමැත්ත පළ කරන්නේ නම් ඔහු ප්‍රදානමික සාමාජිකයකු ලෙස තවදුරටත් සිටිය හැකිය. ණය මුදලට අමතරව සාමාජික ගාස්තු ගෙවීමට ඔහු කැමති නම් ඔහුට නව සාමාජිකත්වයක් ලබා ගත හැකි ය. කෙසේ වුව ද, 13(1) රීතියේ වැටුප් ණයක් ප්‍රදානය කරන විට ඔහු නව සාමාජිකයකු ලෙස සළකනු ලැබිය යුතු ය.''.

(ආ) 13 වන රීතියේ -

(1) එහි වගුවෙහි ණය හිමිකම් වගුවේ (II) තීරයේ 6 වන අයිතමයේ ඇති ''රු.80,000/-'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''රු.90,000/-'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් -

(2) 13 (අ) රීතියේ ''රු.7,500/-'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''රු.10,000/-'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්,

(3) සංගමයේ සාමාජිකත්වය අවුරුදු 5 ක් සම්පූර්ණ නොකළ සාමාජිකයෙකුට සාමාජිකත්වය අවුරුදු 5 ක් සම්පූර්ණ කළ සාමාජිකයෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා ඇති සංගමයේ සාමාජිකයින් දෙදෙනෙකුගේ ඇප වීම මත මෙම ණය මුදල ලබා ගත හැකි ය ;

(4) (i) 13(ආ) රීතියේ ''රු.50,000/-'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''රු.100,000/-'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) ''මාස 06 ක'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''මාස 03ක'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) 13 (ඇ) රීතියේ ''රු.50,000/-'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''රු.100,000/-'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(6) 13 (ඔ) රීතියේ -

(i) (i) වන ඡේදයේ ''රුපියල් දස දහසක විශේෂ අත්තිකාරම් මුදලක්'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''රුපියල් විසිපන්දහසක් වූ උපරිම මුදලක් වූ විශේෂ අත්තිකාරම් මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) 13(ඔ) රීතියේ (ii) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(iii) (එම්ඒ, එම්ෆිල්, එම්එස්සී) වැනි පශ්චාත් උපාධියක් හදාරන සාමාජිකයකුට රු. 100,000/- ක ණය මුදලක් ප්‍රදානය කිරීම.'' මෙම ණය මුදල සමාන මාසික වාරික 60 කින් ද වර්ෂයකට 10% බැගින් පොලී අනුපාතයක් අනුව ආපසු අයකර ගත යුතු අතර එකී වාරික මාසික වැටුපෙන් 40% ක් වූ උපරිම අඩු කිරීමේ සීමාවකට යටත් විය යුතු ය.'' ;

(iv) රැකියාව ස්ථිර කර ඇති හෝ පරිවාස කාල සීමාවකට යටත්ව ස්ථිර ධූරයකට පත්කර ඇති යම් සාමාජිකයකුට, වර්ෂයකට 12% පොලියක් සහිතව සමාන මාසික වාරික 30 කින් මුදල ආපසු ගෙවීම සඳහා කළමනාකරණ කමිටුව විසින් පනවනු ලබන කොන්දේසි සහිතව මෝටර් බයිසිකලයක් මිල දී ගැනීම සඳහා රු. 200,000/- ක් වූ උපරිම ණය මුදලක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය ;

(v) (iv) වන ඡේදය යටතේ ප්‍රදානය කරනු ලබන ණය සඳහා සංගමයේ සාමාජිකත්වය අවුරුදු 5 ක් සම්පූර්ණ නොකල සාමාජිකයෙකුට සාමාජිකත්වය අවුරුදු 5 ක් සම්පූර්ණ කළ සාමාජිකයෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා ඇති සංගමයේ සාමාජිකයින් දෙදෙනෙකුගේ ඇප වීම මත මෙම ණය මුදල ලබා ගත හැකි ය.

(ඇ) 14(3) වන රීතියෙහි -

(1) (1) වන ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

"(i) (ii) වන හා (iii) වන ඡේදවල සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සහ අවුරුදු පහකට වැඩි සාමාජිකත්වයක් ඇති යම් සාමාජිකයකුට රු. 55,000/- ක පරිත්‍යාගයක් ගෙවිය යුතු ය.'';

(2) (iv) වන ඡේදය වෙන්ව පරිච්ඡින්න කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ.

''(iv) ''වෛද්‍යාධාර ප්‍රදාන අරමුදල'' නම් වූ අරමුදලක් පිහිටුවා ඊට සංගමයේ සෑම සාමාජිකයකුගෙන්ම මසකට රු. 25/- බැගින් බැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.'';

(3) (vi) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් -

''(vii) වක්‍රීකරණ (Refactive) කාච හුවමාරු ශල්‍යකර්මය සඳහා ගෙවනු ලබන රු.7,500/- ක් වූ මුදල රු. 10,000/- ක් දක්වා වැඩි කිරීම.'';

(ඇ) 15(ii) රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීම :-

''(iii) (අ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ සාමාජිකයකුට විශ්‍රාම දීමනාවක් ලබා ගැනීමට හිමිකම් ඇත. විශ්‍රාම යෑමේ දී විශ්‍රාම ගෙවීමක් ගෙවීම 2015.01.01 දින සිට බලාත්මක විය යුතු ය.

| | |
|---|---|
| (අ) 2015.01.01 දින සිට 2015.12.31 දක්වා වූ කාලය තුළ විශ්‍රාම ලැබූ සාමාජිකයකුට | රු. 10,000/- |
| (ආ) 2016.01.01 දින සිට 2016.12.31 දක්වා වූ කාලය තුළ විශ්‍රාම ලැබූ සාමාජිකයකුට | රු. 12,000/- |
| (ඇ) 2017.01.01 දින සිට 2017.12.31 දක්වා වූ කාලය තුළ විශ්‍රාම ලැබූ සාමාජිකයකුට | රු. 14,000/- |
| (ඈ) 2018.08.01 දින හා ඉන් පසුව විශ්‍රාම යන සාමාජිකයකුට | රු. 15,000/- |

(ආ) එවැනි සාමාජිකයන්ගෙන් මසකට රු. 20/- බැගින් දායක මුදලක් අයකරනු ලැබිය යුතු අතර සේවයේ සිටින සෑම සාමාජිකයකුගෙන්ම 2014.10.01 දින සිට බලපවත්නා පරිදි එකී මුදල අඩුකරනු ලැබේ.

(ඉ) 17 වන රීතියේ -

(1) (1) වන ඡේදය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 17(ii) රීතිය 17(i) රීතිය ලෙස නැවත අංක යෙදීමෙන්,

(3) 17(i) රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් රීති ඇතුළත් කිරීමෙන් :-

(ii) ණය මුදල ගෙවීමේ දින සිට ණය මුදල ආපසු ගෙවීමට නියමිත දිනය දක්වා වූ දින සංඛ්‍යාවකට අනුව අනුපාතිකව පොලිය ගණනය කිරීම මගින් අදාළ රීතියේ සඳහන් පොලිය අයකර ගනු ලැබිය යුතු ය ;

(iii) භාණ්ඩාගාර නියෝජිත ලේකම්වරයාගේ එකඟත්වයට යටත්ව, රජයේ සහ වෙළඳපොළේ උච්චාවචනය වන පොලී අනුපාත සැලකිල්ලට ගෙන සංගමය ලබා දෙන ණය සහ පොළිය සංශෝධන කිරීමේ බලය පාලන කමිටුවට ඇත ;

(iv) අදාළ රීතිය යටතේ නිශ්චිතව දක්වා ඇති පොලී අනුපාතය අනුව එක් එක් මාසයක් ඉතිරිව ඇති ශේෂය වන සංගමයෙන් ලබාගත් ණය සඳහා වූ පොලිය ගෙවනු ලැබිය යුතු ය. යම් රීතියක් යටතේ ණය මුදලක් සඳහා පොලී අනුපාතය නිශ්චිතව දක්වා නැත්නම්, එම ණය මුදල මත වර්ෂයකට 8% බැගින් පොලිය අයකරනු ලැබිය යුතු ය ;

(ඊ) 19 වන රීතියේ ''එසේ එකතු වූ පොළිය'' යන වචන වෙනුවට ''එසේ එකතු වූ ණය මුදල'' යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) 25 වන රීතින් (III) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

''(iv) කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු ලෙස නාමයෝජනා කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සාමාජිකයකු ක්‍රියාකාරී සාමාජිකත්වයේ අවුරුදු පහක් සම්පූර්ණ කර තිබිය යුතු ය. නාමයෝජනා කැඳවීම සඳහා වූ අවසන් දිනයට පෙර අඛණ්ඩව මාස හයක කාලයක් සඳහා නාමිකයාගේ, නාම යෝජනා කළ තැනැත්තාගේ සහ නම ස්ථිර කළ තැනැත්තාගේ වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් සෑම අඩු කිරීමක්ම අඩු කර ගත යුතු ය. යම් සාමාජිකයකු මාස හයක් ඇතුළත විශ්‍රාම යෑමට නියමිත නම් සාමාජිකත්වය ගාස්තු ගෙවීම මගින් යාවත්කාලීන කළ යුතු ය.''.

(2) (II) වන පරිච්ඡේදය යන ශීර්ෂය යටතේ -

(අ) 5 වන රීතියේ (i) වන ඡේදය ඉවත් කරනු ලැබිය යුතු අතර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කරනු ලැබේ :-

''(i) දේපළ ණය සඳහා පාලන කමිටුව විසින් අනුමත කරන ලද මුදලින් පළමු රු. 300,000/- ක් සඳහා අයකළ යුතු පොලී ප්‍රමාණය වර්ෂයකට 10% ක් විය යුතු අතර ඉතිරි මුදල සඳහා අයකළ යුතු පොලී ප්‍රමාණය වර්ෂයකට 12% ක් විය යුතු ය.'';

(ආ) 6 වන රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

''(i) දේපළ ණයක් ලබා ගැනීමෙන් පසු උපරිම කාල සීමාව ඇතුළත දෙවන වරටත් දේපළ ණයක් සඳහා ඉල්ලුම් කරන විට, කලින් ඉදිරිපත් කළ තක්සේරු වාර්තාවේ සඳහන් වටිනාකම කලින් ලබාගත් ණය මුදලේ ඉතිරි මුදල සහ දෙවන ණය මුදල සහ මුදල් දෙකේ එකතුවට වඩා වැඩිනම් උකස් දේපළ පරීක්ෂා කර අනුමත කිරීමේ වාර්තාවක් ලබාගත යුතු ය. තක්සේරු වාර්තාව අවුරුදු 2 කට වඩා වැඩි නම් සහ පළමු තක්සේරු වාර්තාවේ සඳහන් වටිනාකම ඉහත කී මුලු තක්සේරු මුදලට වඩා වැඩි නම් අනුමැතියක් අවශ්‍ය වේ. ''.

(ඇ) 10 වන රීතියේ (i) වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''(i) ණය මුදල මාසික වාරික 300 හෝ අදාළ තැනැත්තා වයස අවුරුදු 80 ට එළඹීම යන කාලසීමා දෙකෙන් පළමුවෙන් එළඹෙන දිනයට පෙර ගෙවා නිම කළ යුතු ය.''.

(ඉ) 6(අ) රීතියේ (v) වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''(v) දේපළ ණය 6(අ) (1) රීතිය යටතේ අයකර ගනු ලබන අවස්ථාවක, ඉතිරි ණය මුදල අයකර ගැනීමේ අවසාන දිනය දක්වා ණය මුදලේ පවත්නා ශේෂය මත 0.5% ක් වූ අතිරේක ගාස්තුවක් අය කරනු ලැබිය යුතු ය.

(3) IV වන පරිච්ඡේදය යන ශීර්ෂය යටතේ -

(අ) එම පරිච්ඡේදයේ 4 වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''4. යම් සේවකයකු විසින් තමන්ගේ දූ දරුවන්ට පොත් පත් සහ ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා රු. 4,000/- නොවැඩි ණය මුදලක් ලබාගත හැකි ය.'' ;

(ආ) එම පරිච්ඡේදයේ 5 වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :-

''5. යම් සේවකයකුට උත්සව අත්තිකාරම් මුදලක් වශයෙන් රු. 10,000/- කට නොවැඩි මුදලක් ලබාගත හැකි ය.''.

(ඇ) එම පරිච්ඡේදයේ 5 වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන් -

''පරිගණක ණය

6. සේවකයකුට පරිගණයක් මිල දී ගැනීම සඳහා රු. 75,000/- කට නොවැඩි ණය මුදලක් ලබා ගත හැකි ය.

(i) ණය මුදල මාසික වාරික 50 කින් ආපසු ගෙවිය යුතු අතර වාර්ෂික පොලිය සියයට දහයක් (10%) වේ ;

; (ii) අවුරුදු පහක සේවා කාලයක් ඇති නිලධරයකු හෝ සේවකයකු මෙම ණය මුදල සඳහා සුදුසුකම් ලබන්නේ ය ;

(iii) යම් සේවකයකුගේ සේවා කාලය අවුරුදු 5 කට වඩා අඩු නම් අවුරුදු පහකට වැඩි සේවා කාලයක් ඇති ඇපකරුවන් දෙදෙනකු අවශ්‍ය වේ ;

(iv) යම් සේවකයකු අවුරුදු 55 සම්පූර්ණ කරන විට ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය ලිත් මාස 100 කට වඩා අඩු නම් ඉතිරි මුදල එම සේවකයාගේ පාරිතෝෂික මුදලින් අඩුකර ගත හැකි බවට වූ ප්‍රකාශයක් ඔහු හෝ ඇය ලබා දිය යුතු වේ ;

(v) ඔහුගේ 40% වැටුප් සීමාව අදාළ වේ. ''.

(ඈ) 6 වන හා 7 වන ඡේද පිළිවෙලින් 7 වන සහ 8 වන ඡේද වශයෙන් නැවත අංක යෙදීමෙන්.

03 - 805

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.